## හක්මන ප්‍රාදේශීය සභාව
## මාතර දිස්ත්‍රික්කය.

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 සැප්තැම්බර් 26 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 නොවැම්බර් 23 වන දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හක්මන ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල මිලට ගත් පුස්තකාල පොත් වල වටිනාකම වූ රු.76,025 ක් ප්‍රාග්ධන වැය ගිණුමට හර කරනු වෙනුවට පුනරාවර්තන වැය ගිණුමක් වූ ලිපිද්‍රව්‍ය ගිණුමට හරකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මිලටගත් රු.76,025 ක් වටිනා පුස්තකාල පොත් සඳහා ලද රු.11,274 ක් වූ වට්ටම්, ගිණුම්වල සටහන් කර නොතිබුණි.

(ඇ) කෝංගල දෙවෙනිගෙවත්ත මාර්ගය ඉදිකිරීමට අදාල රු.976,038 ක් වූ වියදම දෙවරක් ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා ණයහිමි ප්‍රාග්ධන ගිණුම හර කර අදාල වියදම් ගිණුම බැරකල යුතු වුවද සමුච්චිත අරමුදල බැරකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු.51,574 ක් ව විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.893,472 ක් වූ දායක මුදල් ගිණුම් ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්.

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 07 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.5,399,544 ක් වූ අතර ලෙජරයට අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.3,678,486 ක් වුයෙන් වෙනස රු.1,721,058 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම.

2010 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.70,702 ක නිරවුල් නොකල හර ශේෂයයක් විය.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 1 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,040,140 කි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 07 කට අයත් රු.110,719,332 ක් වටිනා ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව - 1998 | |
| (i) රීති 143 | එක් එක් තැන්පතු වර්ගය වෙනුවෙන් වෙන්කර ඇති මුදල් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් එක් එක් වර්ෂය අවසානයේ පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 153 | ප්‍රාදේශීය සභා ආකෘති පත්‍ර 07 ප්‍රකාර හිඟ ආදායම් වාර්තා පිළියෙල කර නොතිබුණි. |
| (iii) රීති 164 | සභාවේ ගිණුම් ලියකියවිලි ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු දෛනිකව පරීක්ෂා කර ඒ බවට කෙටි අත්සන් තැබීම මගින් තහවුරු කර නොතිබුණි. |
| (iv) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය ශේෂය සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 418,126 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 345,862 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011 මාර්තු 03 දිනැති මාගේ ලිපියෙන් නියමිත ආකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබු නමුත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශ අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | හිඟ ආදායම් | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | 2010 දෙසැම්බර් 31 දිනට | 2009 දෙසැම්බර් 31 දිනට | % | % |
| | රු. | රු. | | |
| අක්කර බදු | 68,180 | 60,600 | 12 | - |
| වරිපනම් බදු | 714,510 | 768,629 | - | 7 |
| ජල බදු | 1,283,479 | 872,870 | 47 | - |
| කඩ කුලී | 782,445 | 876,345 | - | 11 |
| බිම් බදු | 196,290 | 155,900 | 26 | - |

2.2.2 හිඟබදු ගාස්තු

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාලව අයවිය යුතු රු.782,690 ක බදු හා ගාස්තු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබණි.

2.2.3 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02 කින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා තිබූ රු. 405,136 කවූ දඩ මුදල සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු. 1,810,798 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 වියදම් ව්‍යුහය

---------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම් අතර විචලනයන් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 13,542 | 12,009 | 1,533 | 11,202 | 11,074 | 128 |
| අනෙකුත් | 8,649 | 9,992 | (1,343) | 7,370 | 7,250 | 120 |
| උප එකතුව | 22,191 | 22,001 | 190 | 18,572 | 18,324 | 248 |
| ප්‍රාග්ධන වියදම් | 2,500 | 48,765 | (46,265) | 2,500 | 135,659 | (133,159) |
| | 24,691 | 70,766 | (46,075) | 21,072 | 153,983 | (132,911) |

සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂ 12 කට අදාල රු.131,500 ක් වූ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් ඉතිරිව තිබූ අතර වැය ශීර්ෂ 15 කට වෙන්කල ප්‍රතපාදන ඉක්මවා වැයකර තිබුණෙන් අයවැය ලේඛණය සඵල පාලන කාරකයක් ලෙසට යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 2.4 මානව සම්පත් කලමනාකරණය

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | - |
| ද්විතියික | 08 | 06 |
| ප්‍රාථමික | 26 | 18 |
| වෙනත් (අනියම්/තාවකාලික) | - | 38 |

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්ය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා වූ වියදම රු.11,911,008 ක් වුවද, පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ ඉන් රු.8,098,000 ක් පමණි. මේ අනුව රු.3,813,008 ක් වූ වෙනස සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 උනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධානවලට පටහැනව අනියම් සේවකයින් 38 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සභා අරමුදලින් රු.3,421,651 ක මුදලක් ගෙවා තිබුණි. චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකලහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

2.5 <u>වත්කම් කළමනාකරණය.</u>

2.5.1 <u>නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්</u>

(අ) සභාව සතුව තිබූ රු.1,476,376 ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 05 ක් 2011 සැප්තැම්බර් 28 විගණන පරීක්ෂණ දිනය වන විට නිෂ්ක්‍රියව හා ඌණ උපයෝජිතව පැවතුණි.

(ආ) පහත සඳහන් උපකරණ හා භාණ්ඩ 2011 සැප්තැම්බර් 21 දින වන විටද සුදුස්සක් නොකොට නිශ්ක්‍රියව තිබුණි.

- ❖ ජල පොම්පාගාර වලින් ඉවත්කල විදුලි මෝටර් 04
- ❖ සෙන්ට්‍රික් වතුර පොම්පය.
- ❖ අත්ට්‍රැක්ටර් 02 (යමහා)ලෝරල් රොටරිය සමඟ
- ❖ හොන්ඩා යතුරුපැදිය (131-3031)

2.5.2 <u>අයවීමට ඇති සේවක ණය</u>

2010 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ සේවක ණය ශේෂවල එකතුව රු.3,824,082 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂය රු.3,448 කි.

2.5.3 <u>ලේඛණ පවත්වාගෙන යාමේ අඩුපාඩු</u>

පහත සඳහන් ලේඛණ යාවත්කාලීන හා විධිමත්ව පවත්වා නොතිබුණි.

- ණයහිමි ලේඛණය
- ණයගැති ලේඛණය
- සේවක ණය ලේඛණය.
- තැන්පත් ලේඛණය.
- ආදායම් ලේඛණ

2.6 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා.</u>

2.6.1 <u>වීථි පහන් නඩත්තුව</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විදුලි උපාංග මිලදී ගැනීමේදී අවශ්‍යතාවය පරිදි නඩත්තු විදුලි කාර්මිකගේ ඉල්ලීම හා ඒ සඳහා කාර්මික නිලධාරියාගේ අනුමැතිය පරිදි ඒවා මිලදී ගැනීම සිදුකල යුතු වුවත් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) සභා බල ප්‍රදේශය තුල නඩත්තුව සිදුවන වීථි පහන් එකිනෙක වෙන්කොට හඳුනාගැනීම සඳහා අංක හෝ සංකේත ක්‍රමයක් භාවිතා කරමින් එක් එක් වීථි පහන් සඳහා විදුලි බුබුළු හා අනෙකුත් උපාංග සවි කිරීමේදී ලේඛණයක් පවත්වා නොතිබුණි.

(iii) සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තුව සඳහා සභාව වැයකල රු.136,584 ක මුදල ලංකා විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

2.6.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීම.

මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ ජූනි මාසයේදී මිලදී ගත් බඳුන් 100 කින් රු.25,200 ක් වටිනා බඳුන් 21 ක් 2011 සැප්තැම්බර් 28 දින වන විටද නොබෙදා ඉතිරිව තිබුණෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටකර ගැනීමට නොහැකිවී තිබුණි.

2.6.3 අනවසර ඉදිකිරීම්.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(vii) හි (ඉ)(උ) සහ 126 (ix) වගන්ති පරිදි අනවසර ඉදිකිරීම් 09 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ අතර හක්මන වේපතඉර අමරදාස ගලප්පත්ති මාවතේ අනවසරයෙන් ඉදිකල දෙමහල් ගොඩනැගිල්ලෙන් රු.8,223 ක ආවරණ අනුමැතිය දීමේදී අයකල යුතු ගාස්තු අයකර නොතිබුණි.

2.6.4 ගොඩනැගිලි අයදුම්පත් .

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ හා ඊට පෙර වර්ෂවලට අදාලව සංවර්ධන බලපත්‍ර නිකුත් කල ගොඩනැගිලි අයදුම්පත් සඳහා කාලය දීර්ඝ කරවා ගෙන නොතිබූ අතර තනා නිම කළ ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) ගො.ඉ.2010/09ඒ දරණ ගොඩනැගිලි අයදුම්පත අනුව වර්ග මීටර් 391.40 ක් වූ වාණිජ භාවිතය සඳහා වූ ගොඩනැගිල්ල සඳහා 1986 මාර්තු 10 දින අංක 392/9 හා 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරණ ගැසට් පත්‍රයේ නිවේදනය පරිදි වාහන නැවතුම් ස්ථානයක් ගොඩනැගිලි සැලැස්මේ දැක්විය යුතු වුවද එසේ දක්වා නොතිබූ අතර ඒ අනුව වාහන නැවතුම් ස්ථානයක් සඳහා අයකරගත යුතු රු.500,000 ක ගාස්තු අයකර ගෙන නොතිබුණි.

2.6.5 ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා මන්ත්‍රී දායකත්වය.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සභාපති, උප සභාපති ඇතුළුව මන්ත්‍රීවරුන් 08 දෙනෙකුගෙන් සමන්විත සභාවේ මන්ත්‍රීවරුන් සඳහා රු.585,000 ක දීමනා ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සභා රැස්වීම් වාර 12 ටම සහභාගී වී තිබුණේ සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් හතරදෙනෙකු පමණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී සභාපතිවරයාගේ යෝජනා 05 ක් පමණක් ක්‍රියාත්මක වී තිබූ අතර අනෙකුත් මන්ත්‍රීවරුන්ගෙන් යෝජනා කිසිවක් ඉදිරිපත්වී නොතිබුණි.

2.6.6 ජල ගාස්තු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් නඩත්තු කරන ජල සැපයුම් අංශයේ පාරිභෝගික සංඛ්‍යාව 821 ක් වූ අතර ආදායම් වියදම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ මෙහෙයුම් පාඩුව රු.2,848,185 ක් වුවද විගණනයේදී කරන ලද ගණනය කිරීම් අනුව මෙහෙයුම් පාඩුව රු.2,734,355 ක් විය.

(ii) ජල පාරිභෝගිකයන් 85 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවීමට තිබූ රු.802,121 ක හිඟහිටි මුදල අයකර ගැනීම සඳහා ගිවිසුමේ කොන්දේසි අංක 03 පරිදි ජල සම්බන්ධතා විසන්ධි කිරීම, ඇප මුදලින් අයකිරීම හෝ නීති මගින් කටයුතු කිරීම සිදුකර නොතිබුණි.

(iii) ජල මනු අක්‍රිය වීම හේතුවෙන් සාමාන්‍ය ගාස්තු අයවන ජලපාරිභෝගිකයින් 112 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි මුදල රු.225,060 ක් විය. අක්‍රිය වූ ජල මනු සඳහා අළුතින් ජල මනු සැපයමට කටයුතු නොකිරීම නිසා තථ්‍ය ජල පාරිභෝජනයට නියමිත ගාස්තු අය නොවන බව නිරීක්ෂණය විය.

2.6.7 ගබඩා තොග

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2009 වර්ෂයේ ගබඩාව භාරගත් සංවර්ධන සහකාරවරයාට, ගබඩා තොගය සමීක්ෂණය නොකර භාරදීම නිසා ගබඩා ලේඛණ තුලනය කිරීමකින් තොරව පවත්වාගෙන යමින් තිබුණි.

(ii) 2009 සිට 2011 සැප්තැම්බර් 26 දින දක්වා කාල පරිච්ඡේදය තුල මිලදී ගෙන නිකුත් කල රු.29,740 ක වටිනා භාණ්ඩ වර්ග 04 ක ඌනතාවයක් විය.

(iii) ගබඩා භාණ්ඩ විධිමත් අයුරින් තබා ගැනීම සඳහා ගබඩා පහසුකම් නොමැතිකම හා ගබඩා භාරකරු නොමැති අවස්ථාවල භාණ්ඩ භාර ගැනීම, නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ද නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වියදම් පාලනය

(ඇ) වත්කම් කළමනාකරණය